පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- **488**

ආයතනයේ නම :- **ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டு மாலா இல :- **488**

நிறுவனத்தின் பெயர் :- **குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களம்**

பாராளுமன்ற அரச நிதி சம்பந்தமான தெரிவுக் குழுவினால் சபையில் சமர்ப்பிக்கப்பட்டுள்ள அறிக்கை சம்பந்தமாக நிலையியற் கட்டளை இல 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்பு மற்றும் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் சம்பந்தமாக பாரளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No :- **488**

Name of Institution :- **Department of Immigration & Emigration**

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of the standing order No. 119(4).

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 488

ආයතනයේ නම :- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 488

ආයතනයේ නම :- **ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.**

අංකය	රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු.	නිවැරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය.
01	**<u>ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම</u>** දෙපාර්තමේන්තුවේ සුභ සාධක අරමුදල නීත්‍යානුකූල කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුන් කාරක සභාව, මෙම අරමුදලට ආදායම් ලැබෙන ආකාරය පිළිබඳ සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍ර.ග.නි) වෙත නිර්දේශ කළේය.	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.
02	**<u>විද්‍යුත් ගමන් බලපත්‍රය (e-passport) නිකුත් කිරීම</u>** විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර (e-passport) නිකුත් කිරීම සම්බන්ධ වර්තමාන තත්ත්වය සහ මෙම ක්‍රියාවලිය අවසන් කිරීම දක්වා දින වකවානු ඇතුලත් වාර්තාවක් කාරක සභාව වෙත ලබාදෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මඟින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත ප්‍රසම්පාදව මාර්ගෝපදේශ අනුව ජාත්‍යාන්තර තරඟකාරී ලංසු කැඳවා විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර මිලියන 05 ක් මිළදී ගැනීමේ කටයුතු අවසන් කර ඇත. මේ වන විට දෙපර්තමේන්තුව වෙත විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර1 තොග ලැබෙමින් පවතී. පුද්ගලාරෝපණය සඳහා අවශ්‍ය PKI මිළදී ගැනීම සඳහාද ජාත්‍යාන්තර තරඟකාරී ලංසු කැඳවා ටෙන්ඩරය ප්‍රධානය කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.
03	**<u>e-gates ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම</u>** ගුවන් තොටුපල තුළ සිදුවන තදබදය වලක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට යොජිත e-gates ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු සහ ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දින	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත. මේ වන විට සංක්‍රමිකයන් සඳහා වන

	වකවානු ඇතුළත් වාර්තාවක් 2024 මැයි මස 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. අදාළ වාර්තාව අනුව 2024.05.12 දින පාලක ජනරාල් හා අදාළ තාක්ෂණික කණ්ඩායම e-gates පරීක්ෂා කිරීම සඳහා (Factory Acceptance Test) සහභාගී වී ඇති අතර ප්‍රමාදයකින් තොරව මෙම ව්‍යාපෘතිය අවසන් කළ හැකි බව දැනුම් දී ඇත.	ජාත්‍යාන්තර සංවිධානය Intenational Orgnaization for Migration) ප්‍රධානයක් වශයෙන් පැමිණීමේ පරියන්තය සඳහා e-gates ස්ථාපිත කර ඇත. මීට අමතරව පිටවීමේ පර්යන්තය සඳහාද Airport nad Aviation Services Sri Lanka (AASL) මඟින් e-gates ලබාදීමේ කටයුතු ආරම්භ කර ඇත.
04	<u>ගුවන් තොටුපල කාර්ය මණ්ඩලය එලදායි ලෙස සේවයේ යෙදවීම</u> ගුවන් ගමන් කාලසටහන අනුව කාර්යබහුල අවස්ථාවන් සඳහා වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කළ කාරක සභාව, සේවා මුර (Duty Roster) සකස් කිරීමේදී, දැනට ක්‍රියාත්මක වන ආකාරයට දිවා සහ රාත්‍රී සේවා මුරයන් සඳහා සමාන සේවක පිරිස් යෙදවීම වෙනුවට ගුවන් තොටුපල කාර්ය මණ්ඩලය වඩාත් එලදායී ලෙස යොදවා ගැනීම සම්බන්ධයෙන් ගන්නා කියාමාර්ග ඇතුළත් වාර්තාවක් 2024 මැයි මස 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. ඒ අනුව පැය 24 සේවා කාලයක් සඳහා නිලධාරීන් 133 ක් අවම වශයෙන් අවශ්‍ය වුවත් නිලධාරී හිඟය නිසා එම ප්‍රමාණය සේවයේ යෙදවීම ප්‍රායෝගිකව කළ නොහැකි බවත්, දැනට සිටින නිලධාරීන් කළමනාකරණය කර ගනිමින් දිවා කාලයට වඩා වැඩි පිරිසක් රාත්‍රී සේවා මුර සඳහා යොමු කර ඇති බවත් සඳහන් කර ඇත.	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත. 2025 වසර තුළදී සීමිත පදනම යටතේ බලයලත් නිලධාරීන් 45 දෙනෙකු සහ විවෘත පදනම යටතේ බලයලත් 64 දෙනෙකු අළුතින් බඳවා ගැනීම සිදු කර ඇත. මීට සමගාමීව බලයලත් නිලධාරීන් 56 දෙනෙකුට වැඩබලන ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් ලෙස උසස් වීම් ලබා දෙන ලදී. 2025 වසර තුළ මෙහෙයුම් සහකාර නිලධාරීන් 50 දෙනෙකු මෙම දෙපාර්තමේන්තුව වෙත බඳවා ගැනීම සිදු කර ඇත. ගුවන්තොටුපල තුළ වර්තමානය වන විට රාජකාරී සඳහා මාසික සේවා මුර ලේඛණයෙන් දිනකට අනුයුක්ත කරනු ලබන නිලධාරීන් ප්‍රමාණය පෙරට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. ගුවන්තොටුපල රාජකාරී සඳහා රාජකාරී සේවා මුර ලේඛණයෙන් යොදවනු ලබන මුළු බලයලත් නිලධාරීන් සංඛ්‍යාව 314 ක් පමණ වේ. ඒ අනුව දිනකට සේවා මුර ලේඛණයෙන් දළ වශයෙන් දිවා සේවා මුරයක් සඳහා බලයලත් නිලධාරීන් 55 ක් සහ රාත්‍රී සේවා මුරයක් සඳහා නිලධාරීන් 70 ක් පමණ රාජකාරී සඳහා අනුයුක්ත කරනු ලබයි.

		ගුවන්තොටුපත තුළ මෙහෙයුම් ක්‍රියාවලිය හා බලයලත් නිලධාරීන්, මෙහෙයුම් සහකාර නිලධාරීන් හා අනෙකුත් දෙපාර්තමේන්තුව අනුයුක්ත නිලධාරීන් කටයුතු මනා ලෙස අධීක්ෂණය කිරීම සඳහා එක් සේවා මුරයක් සඳහා ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් 10 දෙනෙකු පමණ රාජකාරී සඳහා යොදවනු ලබයි. ගුවන්තොටුපල මගී හැසිරවීමේ ක්‍රියාවලියට සහාය දැක්වීම සඳහා එක් සේවා මුරයක් සඳහා මෙහෙයුම් සහකාර නිලධාරීන් 7 දෙනෙකු පමණ සේවය සඳහා අනුයුක්ත කරනු ලබයි. වර්තමානය වන විට මගී තදබදයක් පවතින අවස්ථාවලදී මගී තදබදය මනා ලෙස කළමනාකරණය කරමින් මගී සේවා කවුළු ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් දෛනික ගුවන්තොටුපල රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කරනු ලැබේ. ගුවන් ගමන් කාලසටහන අධ්‍යයනය කරමින් ගුවන්තොටුපල කටයුතු කාර්යබහුල වනවිටදී මනා අධීක්ෂණයන් පවත්වා ගනිමින් මගී තදබදය නියාමනය කිරීමට ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් විසින් ක්‍රියා කරනු ලබයි. තවද මගීන් නිසි ලෙස ආගමන විගමන කවුළු වෙත යොමු කිරීම හා මගීන් සඳහා අවශ්‍ය සහය ලබාදීම වෙනුවෙන් මෙහෙයුම් සහකාර නිලධාරීන් කටයුතු කරයි
05	**<u>Henley Passport Index ශ්‍රේණිගත කිරීම</u>** මෙම ශ්‍රේණිගත කිරීමේ එක් එක් නිර්ණායක වලට අදාළව, ශ්‍රී ලංකාව දැනට සිටින තත්වය සහ පවත්නා තත්ත්වය දියුණු කර ගැනීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.	මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ PS/IA/E&I/109/02/24 හා 2025/01/16 දිනැති පාර්ලිමේන්තු මහ ලේකම්ගේ ලිපිය මඟින් Henley Passport Index ශ්‍රේණිගත කිරීම් වලදී ශ්‍රී ලංකාව දැනට සිටින තත්ත්වය වැඩිදියුණු කර ගැනීම සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ග ඇතුලත් වාර්තාවක් රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.
06	**<u>ප්‍රාදේශීය කාර්යාල වල තත්ත්වය</u>** විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ස්ථාපිත කර ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල තත්ත්වය ඉතාමත් අසතුටුදායක මට්ටමක	වර්තමානයේ ගමන් බලපත්‍ර3 වල හිඟයක් නොමැති බැවින් ප්‍රාදේශීය කාර්යාල වලට ගමන් බලපත්‍ර ලබාගැනීමට පැමිණෙන සේවාලාභීන් සියළු දෙනාට ගමන් බලපත්‍ර නිකුත් කරයි. එසේම පසුගිය වර්ෂය තුළ යාපනයේ නව ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත

	පවතින බව කාරක සභාව සඳහන් කළේය.	කර ඇති බැවින් වවුනියාව කාර්යාලයේ තදබදය අඩු වී ඇත. එසේම ප්‍රාදේශීය කාර්යාලවලට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම ප්‍රධාන ගැටළුවක් වේ. මාතර කාර්යාලය වඩා ඉඩපහසු ස්ථානයකට ගෙනයාමට සැලසුම් කර ඇත. නුවර හා කුරුණෑගල කාර්යාල සඳහා නව කාර්යාල පහසුකම් ලබා ගැනීමට උත්සාහ කරමින් සිටී.
07	<u>විදේශිකයින් මෙරට ව්‍යාපාර කටයුතුවල නිරතවීම</u> සංචාරක වීසා (Visit Visa) මත මෙරට රැඳී සිටින විදේශීය ජාතිකයින් විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට ව්‍යාපාර කටයුතුවල යෙදීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ දකුණු පළාත ආශ්‍රිතව මෙවැනි කටයුතු බහුලව සිදු වන බව පෙන්වා දුන් කාරක සභාව කඩිනමින් මෙවැනි කටයුතු නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව අවධාරණය කළේය.	සංචාරක වීසා (Visit Visa) මත මෙරට රැඳී සිටින විදේශීය ජාතිකයින් විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට ව්‍යාපාර කටයුතුවල යෙදීම සම්බන්ධයෙන් ආවේක්ෂණ කටයුතු පුළුල් කර ඇත. එසේම ශ්‍රී ලංකා පොලිසිය සමඟ එක්ව විමර්ශණ කටයුතු සිදු කරයි. 2026 වර්ෂයේ පළමු කාර්තුව තුළ මෙසේ අනවසරයෙන් රැඳී සිටි විදේශිකයන් 700 ක් පමණ නැවත තම රට වෙත යැවීමට කටයුතු කර ඇත.
08	<u>දිරි දීමනා ගෙවීම</u> දැනට දිරි දීමනා ක්‍රමය පිලිබඳව විස්තර ඇතුළත් වාර්තාවක් 2024 මැයි 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නී.. වෙත නිර්දේශ කළේය.	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මඟින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දිරි දීමනා ගෙවීම, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-8/ALLOW/04/125/2 හා 2012.09.05 දිනැති ලිපිය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සැලකිල්ලට ගනිමින් කොන්දේසි සහ සංශෝධිත දීමනා පිළිබඳව මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට යටත්ව අනුමත කර ඇත. එම ලිපියෙහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව තිබියදී, එහි 02 ඡේදයේ සඳහන් I,II,III සහ IV කොන්දේසි සංශෝධනය කරමින් 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි වැටුප් අදාල කර ගැනීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-7/04/ALLOW/0125(iii) හා 2025.12.07 දිනැති

		ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මේ වන විට ඉහත අනුමැතිය පරිදි දිරි දීමනා ගෙවනු ලබයි. තවද පවතින දිරි දීමනා ක්‍රමය සමාලෝචනය කිරීම සඳහා අදාළ කම්ටු පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු ද මේ වන විට සිදුකරමින් පවතී.
09	**<u>CCTV කැමරා 62 ක් 2017 වසරේ සිට භාවිතයට නොගෙන ගබඩා කර තැබීම</u>** CCTV කැමරා 62 ක් වසර 6 ක් තිස්සේ භාවිතයට නොගෙන ගබඩා කර තැබීම පිලිබඳව බලවත් අප්‍රසාදය පළ කළ කාරක සභාව, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කම්ටුවක් පත්කර මෙම කැමරා සවි කිරීම සඳහා සැලැස්මක් සකස් කොට, එම සැලැස්මට අනුව තවදුරටත් අවශ්‍ය උපකරණ මොනවාද යන්න සොයා බලා, මෙම කැමරා සවිකර අවසන් කරනු ලබන දින වකවානු ඇතුළත් වාර්තාවක් 2024 මැයි මස 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මඟින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත. අදාල **CCTV** කැමරා 62 මේ වන විට දෙපාර්තමේන්තුව තුළ සවිකර ක්‍රියාකාරී මට්ටමේ පවතී
10	**<u>හිස් ගමන් බලපත්‍ර මිලදී ගැනීම එකම ආයතනයක් මඟින් සිදු කිරීම</u>** ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් වසර 21 ක් තිස්සේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව එකම ආයතනයකින් හිස් ගමන් බලපත්‍ර ලබා ගන්නා බව කාරක සභාව අනාවරණය කළේය. එසේම, හිස් ගමන් බලපත්‍රවල අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන සිදු කර ඇති මෙම මිළදී ගැනීම බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයට ද හේතුවක් වී තිබෙන බව කාරක සභාවේදී අනාවරණය විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ජාත්‍යාංතර තරඟකාරී ලංසු කැඳවා විදෙස් ගමන් බලපත්‍ර මිලියන 05 ක් මිළදී ගැනීමේ කටයුතු අවසන් කර ඇත. ඒ අනුව 2024 වර්ෂයේ සිට **Thales DIS Finland Oy** සමාගමෙන් මිලදී ගැනීම් කටයුතු සිදු කරයි.

11	**<u>ගමන් බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම</u>** 2024 පෙබරවාරි 01 දින සිට සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තු රු. 5000/= සිට රු. 10000/= දක්වා වැඩි කිරීමේදී පනත ප්‍රකාරව කටයුතු කර නොතිබීම කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු විය.	ඉදිරියේදී අවශ්‍ය වුවහොත් පනත ප්‍රකාරව කටයුතු කර ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාල පිරිවැය අනුව ගමන් බලපත්‍ර ගාස්තු සංශෝධනයක් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
12	**<u>නීනි විරෝධීව රට තුළට පැමිණෙන අය රඳවා තබන ස්ථාන</u>** මේ සඳහා 100 දෙනෙකුට පහසුකම් සහිතව වැලිසර ප්‍රදේශයේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවත්, රාගම ප්‍රදේශයේ අක්කර 2 ක ඉඩමක් මේ වන විට ලබාගෙන ඇති අතර, එහි ජ්‍යාත්තාන්තර ප්‍රමිතියට අනුකූල වන ලෙස ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යේජිත බවත් ග.නි. සඳහන් කර සිටියේය.	නව රැඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමට ආදාල ව්‍යාපෘති යෝජනාව නිර්දේශ කර මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2026.03.31 දින යොමු කර ඇත.
13	**<u>කටුනායක ගුවන් තොටුපල තුළ CCTV කැමරා සවි කිරීම</u>** කටුනායක ගුවන් තොටුපල පර්යන්තයේ මගී තොරතුරු ලබා ගැනීම සඳහා කවුන්ටර වල සවි කිරීමට යෝජිත CCTV කැමරා පද්ධතිය පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් 2024 මැයි මස 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නී.වෙත නිර්දේශ කළේය.	මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක **PS/IA/E&I/109/02/24** හා 2024.05.14 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත. කටුනායක ගුවන්තොටුපල පර්යන්තයේ සියළු පරිපාලන කටයුතු සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් සිදු කරන බැවින් මගී තොරතුරු ලබා ගැනීම සඳහා **CCTV** සවිකිරීම එම අධිකාරිය මඟින් සිදු කරයි.

කේ.එම්.ආනන්ද විජේපාල

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය

කේ.එම්. ආනන්ද විජේපාල (පා.ම)
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල